**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරී තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම**

1930/12 - 2015.09.01 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 10.3.3 වගන්තිය හා මෙම තනතුරු සඳහා 2015.04.10 දිනැතිව අනුමත බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරී තනතුරේ පුරප්පාඩු දෙකක් (02) සේවා පළපුරුද්ද හා කුසලතාවය මත සම්පූර්ණ කිරීම සඳහා එම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරී තනතුරේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් සක්‍රීය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. සුදුසුකම් :**

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ තාක්ෂණ නිලධාරී තනතුරේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධි විධානයන්ට අනුකූල ව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. I ශ්‍රේණියට නියමිත තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
(අංක 1930/12 හා 2015.09.01 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන 2013.06.01 දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.)

**03. මාසික වැටුප් ක්‍රමය හා වැටුප් පරිමාණය :**

| | | |
|---|---|---|
| චක්‍රලේඛ අංකය | - | රා.ප. චක්‍රලේඛ 10/2025 |
| වැටුප් කේත අංකය | - | MN 7-2025 |
| වැටුප් පරිමාණය | - | 71,240 – 11x1,360 – 18x1,850 - 119,500/- හි 04 වන වැටුප් පියවර ආරම්භක වැටුප් පියවර වේ. |

**04. උසස් කිරීමේ ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

උසස් කිරීම ක්‍රියාත්මක වන දිනය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය වනු ඇත.

**05.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය

| අනු අංකය | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | <u>**සේවා පළපුරුද්ද සඳහා**</u><br><br>* අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ තාක්ෂණ නිලධාරී තනතුරේ I ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ඉක්මවා සපුරා ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.<br><br>* වැඩිම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට සේවා පළපුරුද්ද සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණය ද, සෙසු නිලධාරීන්ට පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>සේවා පළපුරුද්ද සඳහා වෙන්කර ඇති උපරිම ලකුණ / එම ශ්‍රේණියේ වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු x12+මාස) X අදාළ නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු x12+මාස) | 50 | 50 |
| 02. | <u>**කුසලතාවය**</u> | | 45 |
| | I. ක්ෂේත්‍රයට අදාළව හදාරා ඇති<br>උපාධි පාඨමාලාව - ලකුණු 10 බැගින්<br>ඩිප්ලෝමා පාඨමාලා - ලකුණු 5 බැගින්<br>සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 3 බැගින් | 15 | |
| | II. ක්ෂේත්‍රයට අදාළව හදාරා ඇති පුහුණු<br>දින 3 හෝ ඊට අඩු - ලකුණු 1 බැගින්<br>දින 3 - දින 10 අතර - ලකුණු 2 බැගින්<br>දින 10 ට වැඩි - ලකුණු 3 බැගින් | 10 | |
| | III. ක්ෂේත්‍රයට අදාළව හිමිකරගෙන ඇති සම්මාන සහතික<br>ජාතික මට්ටමේ - ලකුණු 2 බැගින්<br>අන්තර් ජාතික මට්ටමේ - ලකුණු 2.5 බැගින් | 5 | |
| | IV. හදාරා ඇති ඉංග්‍රීසි භාෂා පාඨමාලා<br>ඩිප්ලෝමා පාඨමාලා - ලකුණු 5 බැගින්<br>සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 3 බැගින් | 5 | |
| | V. හදාරා ඇති පරිගණක පාඨමාලා<br>ඩිප්ලෝමා පාඨමාලා - ලකුණු 5 බැගින්<br>සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 3 බැගින් | 5 | |
| | VI. පොදු 230 b ආකෘතියෙන් ආයතන ප්‍රධානියා වෙතින් ලද ප්‍රශංසා සඳහා සඳහා එක් සහතිකයකට ලකුණු 1 බැගින් | 5 | |
| 03. | <u>**සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය**</u><br><br>භාෂා හැකියාව - ලකුණු 01<br>සන්නිවේදනය - ලකුණු 02<br>පෙන්නුම් කරන නායකත්ව කුසලතා - ලකුණු 02 | 5 | 5 |
| | එකතුව | 100 | |

සටහන

- ❖ බඳවා ගැනීමේ දී හෝ කාර්යක්ෂමතා කඩඉම්වල දී සලකා බැලූ සුදුසුකම්වලට අමතරව ලබා ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

- ❖ ඉහත 2.I, 2. II සහ 2.III සුදුසුකම් වෘත්තියට ඇතුළත් වූ පසු ලබාගත් සුදුසුකම් විය යුතුය.

- ❖ සියලුම ඩිප්ලෝමා - මාස 06 කට නොඅඩු හෝ පැය 720 ට නොඅඩු සහ සහතික පත්‍ර පාඨමාලා මාස 03 කට නොඅඩු හෝ පැය 360 ට නොඅඩු විය යුතුය.

- ❖ උපාධි / ඩිප්ලෝමා / සහතික පත්‍ර පාඨමාලා සඳහා ලබාගෙන ඇති සහතික පත්‍රවලට ලකුණු ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා එම සහතික පත්‍රවල නිරවද්‍යතාවය අදාළ විශ්ව විද්‍යාලය/ අධ්‍යාපන ආයතනය මඟින් සනාථ කරන ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

- ❖ ඉහත 2.I, 2.II හා 2.Vයටතේ සඳහන් සියලු සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන ආයතනයක් වෙතින් ලබා ගත් සුදුසුකම් විය යුතු අතර සහතික පත්‍ර හා ලේඛන මඟින් සම්මුඛ පරීක්ෂණයේ දී සනාථ කරනු ලබන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.
(සියලුම සහතික පත්‍ර හා ලේඛන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතු ය.)

6. අයදුම්පත් යොමු කිරීම :

   මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2026.06.19 දිනය හෝ ඊට පෙර " අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, නො. 163, කිරුළපන මාවත, කොළඹ 05" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙත අතින් ගෙනවිත් භාරදිය යුතු ය. නියමිත දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් නොකළ හොත් ඔබ මෙම තනතුර සඳහා අයදුම් නොකරන ලද අයෙකු ලෙස සලකා කටයුතු කරනු ලැබේ. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ " ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී තනතුරේ විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා අයදුම් කිරීම " යනුවෙන් සඳහන් කළ යුතු ය.

7. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම</u>**

1. මුලකුරු සමඟ නම : ..........................................................................................
2. සම්පූර්ණ නම : ..........................................................................................

   ..........................................................................................
3. දැනට දරන තනතුර : ..........................................................................................
4. උපන් දිනය : ..........................................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................
6. දැනට සේවය කරන අංශය : ..........................................................................................
7. ස්ථිර ලිපිනය : ..........................................................................................
8. රාජකාරී ලිපිනය : ..........................................................................................
9. තාක්ෂණ නිලධාරී තනතුරේ,

   I. මුල් පත්වීමේ දිනය :
   ..........................................................................................
   II. ශ්‍රී ලං.තා.සේ. I ශ්‍රේණියට පත් වූ දිනය:
   ..........................................................................................
   III. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නම් සමත් වූ දිනය:
   ..........................................................................................
   IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය:
   ..........................................................................................

10. තාක්ෂණ නිලධාරී තනතුරේ I ශ්‍රේණියේ වසර 06 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය:

    ..........................................................................................

11. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙරාතුව වසර 06 ක කාර්ය සාධනය හා වැටුප් වර්ධක උපයා ගැනීම පිළිබඳ විස්තර:

| අනු අංකය | වර්ෂය | කාර්ය සාධනයේ ප්‍රමාණනය | වැටුප් වර්ධක උපයා ගැනීම (දිනය) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. වෘත්තීය සුදුසුකම් :

I. ක්ෂේත්‍රයට අදාළව හදාරා ඇති පාඨමාලා

| අනු අංකය | පාඨමාලාව | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

II. ක්ෂේත්‍රයට අදාළව හදාරා ඇති පුහුණු

| අනු අංකය | පාඨමාලාව | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

III. ක්ෂේත්‍රයට අදාළව හිමි කරගෙන ඇති සම්මාන/සහතික

| අනු අංකය | සම්මානය/සහතිකය | ආයතනය | දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

IV. හදාරා ඇති ඉංග්‍රීසි භාෂා පාඨමාලා

| අනු අංකය | පාඨමාලාව | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

V. හදාරා ඇති පරිගණක පාඨමාලා

| අනු අංකය | පාඨමාලාව | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. නිලධාරියා විසින් I ශ්‍රේණියට උසස් වූ පසු ලබා ඇති වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු පිළිබඳ විස්තරය :

| වර්ෂය | අඩ වැටුප් සහිත නිවාඩු | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

14. තාක්ෂණ නිලධාරී I ශ්‍රේණියේ සේවා කාලය තුළ මෙම අයදුම්කරුට එරෙහිව පැවති / පැවැත්වෙන විනය පරීක්ෂණ පිළිබඳ තොරතුරු :

| වරද කළ දිනය | විනය නියෝගයේ දිනය | දඬුවම් පිළිබඳ ව විස්තරය | නොනිමි විනය කරුණු පවතීද? |
|---|---|---|---|
| | | | |
| | | | |

15. අයදුම්කරුගේ ප්‍රකාශය:

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : ........................................... ................................................

ඉල්ලුම්කරුගේ අත්සන

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය:

මෙම ඉල්ලුම්කරු වන ........................................................................... මයා/මිය/මෙනවිය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරියෙකු ලෙස දැනට සේවය කරන බවත්, I ශ්‍රේණියේ වසර 06 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බවත්, ඔහුට/ ඇයට විරුද්ධව නොනිමි විනය කරුණු පවතින/ නොපවතින බවත් සහතික කරමි. මෙම අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු නිවැරදි බව හා තාක්ෂණ නිලධාරී විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම් කිරීමට මෙම අයදුම්කරු/ අයදුම්කාරිය විසින් සුදුසුකම් සපුරා ඇති බව / නොමැති බව සහතික කරමි.

දිනය: ...................................

අත්සන : .........................................

නම : .........................................

තනතුර : .........................................

නිල මුද්‍රාව : .........................................